# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
# அனர்த்த முகாமைத்துவ நிலையம்
# DISASTER MANAGEMENT CENTRE

අංක 120/2,
විද්‍යා මාවත,
කොළඹ 07

எண் 120/2
வித்யா மாவத்தை
கொழும்பு 07

No 120/2,
Vidya Mawatha,
Colombo 07


ඔබේ අංකය / உமது இல / Your No. }

මගේ අංකය / எனது இல } DMC/ 08/ Weather Forecast

දිනය / திகதி } 2026.01.08

යුද්ධ හමුදාධිපති,

ගුවන් හමුදාපති,

නාවික හමුදාධිපති,

පොලිස්පති,

අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව,

අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව,

සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,

**<u>පූර්ව අනතුරු ඇඟවීමේ නිවේදනයයි.</u>**

2026.01.08 වන දින 0530 පැයට කාලගුණ විද්‍යා දෙපාර්මේන්තුව විසින් නිකුත් කරන ලද කාලගුණ නිවේදනය හා බැඳේ.

02. එබැවින් සිදුවිය හැකි ආපදා තත්ත්වයන් අවම කිරිමට / පාලනය කර ගැනිමට හා කළමනාකරණය කර ගැනිම සඳහා මෙම නිවේදනය අනුව කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

03. තවද එම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නිවේදන පිළිබඳව විමසිලිමත්ව කටයුතු කරන මෙන් ද මෙම නිවේදන පිළිබඳ විස්තර ලබා ගැනිම සඳහා 117 දුරකථන අංකය අමතන ලෙසටද වැඩිදුර තාක්ෂණික උපදෙස් ලබා ගැනිම සඳහා **<u>කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව</u>** සමඟ සම්බන්ධීකරණය වන ලෙසටද කාරුණිකව ඉල්ලා සිටිමි.

හිරාන් තිලකරත්න
නියෝජ්‍ය අධ්‍යක්ෂ
රාජකාරි භාර නිළධාරී
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**2026 ජනවාරි මස 08 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2026 ජනවාරි මස 08 දින උදෑසන 05.30 ට නිකුත්කරන ලදි.**

**ශ්‍රී ලංකාවට ගිනිකොණ දෙසින් බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ ස්ථාපිතව පවතින පීඩන අවපාතය ඊයේ (07) රාත්‍රී 11.30 වන විට පොතුවිල් සිට 490 km ක් ගිනිකොණ දෙසින්, අක්ෂාංශ 5.3°N සහ දේශාංශ 86.0°E ආසන්නයේ කේන්ද්‍රගතව පැවතුනි. එය බටහිරට බරව වයඹ දෙසට ගමන් කරමින් ඉදිරි පැය 24 තුල දිවයිනේ නැගෙනහිර වෙරළ වෙත ලගාවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම පද්ධතිය ඉදිරි පැය 12 තුළ ගැඹුරු පීඩන අවපාතයක් දක්වා තවදුරටත් වර්ධනය වීමට බොහෝ දුරට හැකියාව පවතී.**

**දිවයිනේ බොහෝ ප්‍රදේශවල අහස වලාකුළින් බරව පවතී.**

උතුරු, උතුරු-මැද, නැගෙනහිර, ඌව, මධ්‍යම සහ දකුණු පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

සෙසු ප්‍රදේශවල පස්වරු 1.00 න් පමණ පසුව තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

නැගෙනහිර සහ ඌව පළාත්වල ඇතැම් ස්ථානවලට **මි.මී. 100 ට වැඩි තද වැසි** ඇති විය හැකි අතර දිවයිනේ සෙසු ප්‍රදේශවල ඇතැම් ස්ථානවලට **මි.මී. (50-75) ක පමණ තරමක තද වැසි** ඇති විය හැක.

මධ්‍යම කඳුකරයේ නැගෙනහිර බෑවුම් ප්‍රදේශවලත්, උතුරු, උතුරු-මැද, වයඹ සහ නැගෙනහිර පළාත්වලත්, හම්බන්තොට, ගම්පහ, කොළඹ සහ මොනරාගල දිස්ත්‍රික්කවලත් විටින් විට හමන **පැ.කි.මී. (50-60) පමණ** තද සුළං ඇති විය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

**WEATHER FORECAST FOR 08 JANUARY 2026**
**Issued at 05.30 a.m. on 08 January 2026**

**The depression over the Bay of Bengal, located to the southeast of Sri Lanka, was centered near latitude 5.3°N and longitude 86.0°E, about 490 km southeast of Pottuvil, at 11:30 p.m. yesterday (07). It is expected to move west-northwestwards and towards the eastern coast of the island during next 24 hours. This system is likely to intensify further into a deep depression during next 12 hours.**

**Cloudy skies can be expected over most parts of the island.**

Showers or thundershowers will occur at times in Northern, North-central, Eastern, Uva, Central and Southern provinces.

Showers or thundershowers may occur at several places elsewhere in the Island after 1.00 p.m.

**Heavy falls above 100 mm** are likely at some places in Eastern and Uva provinces. **Fairly Heavy falls about (50 - 75) mm** are likely at some places in the other areas of the island.

**Strong winds about (50-60) kmph** can be expected at times over Eastern slopes of the central hills, Northern, North-central, North-western and Eastern provinces and in Hambantota, Gampaha Colombo and Monaragala districts.

**The general public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2026 ජනවාරි මස 08 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

**ශ්‍රී ලංකාවට ගිනිකොණ දෙසින් බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ ස්ථාපිතව පවතින පීඩන අවපාතය ඊයේ (07) රාත්‍රී 11.30 වන විට පොතුවිල් සිට 490 km ක් ගිනිකොණ දෙසින්, අක්ෂාංශ 5.3°N සහ දේශාංශ 86.0°E ආසන්නයේ කේන්ද්‍රගතව පැවතුනි. එය බටහිරට බරව වයඹ දෙසට ගමන් කරමින් ඉදිරි පැය 24 තුල දිවයිනේ නැගෙනහිර වෙරළ වෙත ලගාවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම පද්ධතිය ඉදිරි පැය 12 තුළ ගැඹුරු පීඩන අවපාතයක් දක්වා තවදුරටත් වර්ධනය වීමට බොහෝ දුරට හැකියාව පවතී.**

**අද (ජනවාරි මස 08) දින සිට නැවත දැනුම් දෙන තුරු දිවයින වටා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවලින් වැළකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ.**

**ධීවර සහ නාවික කටයුතුවල යෙදෙන ප්‍රජාව, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන ඉදිරි නිවේදන පිළිබඳව අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.**

**වැසි තත්ත්වය:**

මන්නාරම සිට කන්කසන්තුරය, ත්‍රිකුණාමලය, පොතුවිල් සහ හම්බන්තොට හරහා ගාල්ල දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක.

**සුළඟ:**

සුළං ඊසාන දෙසින් හමා එයි. සුළගේ වේගය **පැ.කි.මී. (35-45)** පමණ වේ. දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. (60-70)** දක්වා ඉහළ යා හැක.

**මුහුදේ ස්වභාවය:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු සිට ඉතා රළු වේ.

කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය සහ පොතුවිල් හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල මුහුදු රළ උස **මීටර් (2.5 – 3.5)** ක් පමණ ඉහළ යාමේ හැකියාවක් පවතී. (මෙය ගොඩබිමට එන රළ උස නොවේ).

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
**GENERAL WEATHER FORECAST FOR SRI LANKA**
ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදී
Issued by Forecasting Division, National Meteorological Centre

**WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS**
**Issued at 05.30 a.m. on 08 January 2026**

**The depression over the Bay of Bengal, located to the southeast of Sri Lanka, was centered near latitude 5.3°N and longitude 86.0°E, about 490 km southeast of Pottuvil, at 11:30 p.m. yesterday (07). It is expected to move west-northwestwards and towards the eastern coast of the island during next 24 hours. This system is likely to intensify further into a deep depression during next 12 hours.**

**Naval and fishing communities are warned not to venture to the deep and shallow sea areas around the island until further notice from today (08th January).**

**Navel and fishing communities are requested to be attentive to the forecasts and bulletins issued by the Department of Meteorology in this regards.**

**Condition of Rain:**

Showers or thundershowers will occur at several places in the sea areas off the coast extending from Mannar to Galle via Kankasanthurai, Trincomalee and Pottuvil. Showers or thundershowers may occur at several places in the other sea areas around the island in the evening or night.

**Winds:**

Winds will be north-easterly and wind speed will be **(35-45) kmph**. Wind speed can increase up to **(60-70) kmph** at times in the sea areas around the island.

**State of Sea:**

The sea areas around the island will be **rough to very rough** at times.

The wave height may increase **(about 2.5 – 3.5 m)** in the sea areas off the coast extending from Kankasanthurai to Hambantota via Trincomalee and Pottuvil (this is not for land area).

**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.**